12 වෙළුම
1 කලාපය
2016
ජනවාරි-මාර්තු

Archaeological Society of Sri Lanka

# පුරාවිද්‍යා පුවත්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පුවත් හසුන

## ස්වර්ණ ජයන්ති සංවත්සර වැඩසටහන්වල ප්‍රගතිය

2016 මාර්තු මාසයට යෙදෙන ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ස්වර්ණ ජයන්ති සංවත්සරය වෙනුවෙන් මේ වන විට ක්‍රියාත්මකව ඇති වැඩසටහන්වල ප්‍රගතිය මෙසේය.

- විවෘත රචනා තරඟය - පුරාවිද්‍යා උරුමය පිළිබඳව ජනතාවගේ ආකල්ප හා දැනුම වර්ධනය කිරීමේ අරමුණින් පැවැත්වෙන විවෘත රචනා තරඟය පිළිබඳව විස්තර ඇතුළත් පුවත් මෙරට ජාතික පුවත්පත් කිහිපයක නොවැම්බර් මාසයේදී පළ විය. මේ වන විට දිවයිනේ විවිධ ප්‍රදේශවලින් ඒ සඳහා රචනා ලැබෙමින් පවතී.
- පුරාවිද්‍යා සංහිතා සඟරාවේ විශේෂ කලාපය - ස්වර්ණජයන්තිය නිමිත්තෙන් පළ කිරීමට නියමිත විශේෂ කලාපය සඳහා ප්‍රමාණවත් තරම් ලිපි සංඛ්‍යාවක් මේ වන විට අප වෙත ලැබී ඇත. එහි සංස්කරණ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.
- තැපැල් මුද්දරයක් නිකුත් කිරීම - සංවත්සරය නිමිත්තෙන් තැපැල් මුද්දරයක් නිකුත්කිරීම සඳහා අදාළ බලධාරීන්ගේ මූලික අනුමැතිය මේ වන විට ලැබී තිබේ. ඒ පිළිබඳව සෙසු කටයුතු මේ වන විට සිදුකරමින් තිබේ.
- සංවත්සර සම්මන්ත්‍රණය - ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාවේ නව ප්‍රවණතා යන තේමාව යටතේ පැවැත්වීමට නියමිත මේ සම්මන්ත්‍රණය, ක්ෂේත්‍රයේ ප්‍රවීණ විද්වතුන් කිහිපදෙනකු විසින් පවත්වන දේශනවලින් සමන්විත වනු ඇත. මේ සම්මන්ත්‍රණය සඳහා මූලික කටයුතු පිළියෙල කරමින් තිබේ. එය තැපැල් මුද්දරය එළිදැක්වීම හා රචනා තරගයේ ත්‍යාග ප්‍රදානෝත්සවය හා සමගාමීව පැවැත්වෙනු ඇත.

### සංවත්සරය සඳහා ආධාර කළ සාමාජිකයින්

පුරාවිද්‍යා සංගමයේ ස්වර්ණ ජයන්ති සංවත්සරය සඳහා පහත සඳහන් සාමාජිකයන් මේ දක්වා ආධාර මුදල් ලබාදී ඇත.

- ඩබ්ලිව්. රොබට් ගුණතිලක
- වෛද්‍ය බී. ජී. ඒ. විද්‍යාතිලක
- බී. බෙවන්
- හේමතිලක බණ්ඩාර
- ආර්. ඒ. සුනිමල් රංජිත් කුමාරතුංග
- ඉරෝෂ නානායක්කාර
- කේ. එම්. එච්. කරුණානායක
- සී. හරිශ්චන්ද්‍ර ඉද්දගොඩ
- නම සඳහන් නොකරන මෙන් ඉල්ලා සිටි සාමාජිකයෙක්

පරිත්‍යාගශීලීන් සියලුදෙනාටම පුරාවිද්‍යා සංගමයේ ස්තූතිය හිමි වේ.

**සංගමයේ ස්වර්ණ ජයන්ති සංවත්සරය සඳහා ආධාර කිරීමට බලාපොරොත්තුවන සාමාජිකයන්ට ඒ සඳහා තවමත් අවස්ථාව තිබේ. ඔබේ සියලු ආධාර භාණ්ඩාගාරික ලක්ෂ්මන් රත්නායක මහතාට ලබාදී ලදුපතක් ලබාගන්න. (දුරකතන අංකය - 077-7985543)**

## මාසික වැඩසටහන්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ මාසික අධ්‍යාපන වැඩසටහන් මාලාව යටතේ මීළඟ මාස තුන තුළ පැවැත්වීමට නියමිත වැඩසටහන් මෙසේය.

- **ජනවාරි 10 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:
  ඉන්දියාවේ බෞද්ධ පූජනීය ස්ථාන

  දේශක:
  ඩබ්ලිව්. රොබට් ගුණතිලක මහතා
  (නිදහස් ගවේෂක, ප්‍රවීන ලේඛක හා ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ විධායක සභික)

- **පෙබරවාරි 14 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:
  ශ්‍රී ලාංකීය ගෘහසැලසුම්කරණය කෙරෙහි සංස්කෘත වාස්තුවිද්‍යා සිද්ධාන්තයන්හි බලපෑම

  දේශක:
  පූජ්‍ය උඩවෙල රේවත හිමි
  (කථිකාචාර්ය, සංස්කෘත අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය)

- **මාර්තු මාසයේදී පැවැත්වීමට නියමිත ස්වර්ණ ජයන්ති සංවත්සරය හා වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ විස්තර පසුව දනුම්දෙනු ලැබේ.**

ඉහත දේශන කොළඹ 7, ආනන්ද කුමාරස්වාමි මාවතේ, අංක 96 දරණ තැන පිහිටි රාජකීය ආසියාතික සමිතියේ රැස්වීම් ශාලාවේදී පැවැත්වේ. (මහවැලි කේන්ද්‍ර ගොඩනැගිල්ලේ පළමු මහළේ)

- දේශන පැවැත්වෙන දිනවල ප.ව. 1.00ට සංගමයේ විධායක සභා රැස්වීම පැවැත්වෙන බව කරුණාවෙන් සලකන්න. ඒ සඳහා විධායක සභිකයින්ගේ පැමිණීම අත්‍යවශ්‍ය බව කරුණාවෙන් සලකන්න.

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
1966-2016
ස්වර්ණ ජයන්තිය සමරමු

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ලිපිනය හා දුරකථන අංක


ලිපිනය - සංජීවනී විද්‍යාරත්න මිය
සම්බන්ධීකරණ ලේකම්
ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.

විද්‍යුත් තැපැල - archaeology.org.lk@gmail.com

වෙබ් අඩවිය - www.archaeology.org.lk

ගරු සභාපති
- මහින්ද මලලසේකර 072-3322411

ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති
- රංජිත් හේවගේ 071-1712894

ගරු උප සභාපති
- කාවන් රත්නතුංග 071-7072020

ගරු සමලේකම්වරු
- සමන් අබේසිංහ 071-4864783
- බෙනට් ප්‍රනාන්දු 071-8335882

ගරු සම්බන්ධීකරණ ලේකම්
- සංජීවනී විද්‍යාරත්න 071-5872591


## නිවේදන

- සාමාජික අයදුම්පත් සංගමයේ වෙබ් අඩවියෙන් බාගත (download) කළ හැකිය. (PDF ලේඛනයක් ලෙස)
- පුරාවිද්‍යා සංහිතා 2, 3 හා 5 කලාප සංගමයේ රැස්වීම්වලදී හා සරසවි හා කියවන නුවණ (නුගේගොඩ) පොත්හල්වලින් ලබාගත හැකිය.
- අපගේ Google කණ්ඩායමේ ඊමේල් පණිවුඩ නොලැබේද? එසේ නම් Subject ලෙස Add යොදා නම හා සාමාජික අංකය සඳහන් කරන ඉහත සඳහන් සංගමයේ ඊ-මේල් ලිපිනයට ඊ-මේල් පණිවුඩයක් එවන්න.


**පුරාවිදු පුවත් සංස්කරණය**
ධනේෂ් විසුම්පෙරුම
ගරු සංස්කාරක
dhaneshw@ymail.com


# රාජකීය ආසියාතික සමිතියේ පර්යේෂණ සමුළුව

ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය 9වන වරට සංවිධානය කරන වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය සඳහා පර්යේෂණ පත්‍රිකා කැඳවා තිබේ. මෙවර සම්මන්ත්‍රණය 2016 වර්ෂයේ මාර්තු 24 සිට 26 දින දක්වා පැවැත්වීමට නියමිතය.

සමාජයීය විද්‍යා, දර්ශන අධ්‍යයන, ඉතිහාසය හා පුරාවිද්‍යාව, විද්‍යා-තාක්ෂණ ඉතිහාසය, භාෂා අධ්‍යයන, සෞන්දර්යය අධ්‍යයන හා මාධ්‍ය අධ්‍යයන යන ප්‍රධාන විෂය හතක් යටතේ මේ සමුළුව සඳහා පර්යේෂණ පත්‍රිකා කැඳවා ඇත.

උනන්දුවක් දක්වන පර්යේෂකයින්ට ඉංග්‍රීසි හා සිංහල භාෂාවලින් පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කළ හැකිය. Times New Roman හෝ FM Abhaya අක්ෂරවලින් අක්ෂරයෝජනය කළ, වචන 350කට නොවැඩි පර්යේෂණ සාරාංශ **rasslconference9@gmail.com** ඊමේල් ලිපිනය වෙත යොමු කළ යුතුය. ඊට මුඛ්‍යපද පහක්ද ඇතුළත් විය යුතු ය. ඒ සමග කතුවරයාගේ හෝ කතුවරුන්ගේ නම්, ඔවුන් අනුබද්ධ වී ඇති ආයතන වේ නම් ඒවා, ලිපිනය, දුරකථන හා ෆැක්ස් අංක හා ඊමේල් ලිපිනයද ඇතුළත් කළ යුතුය.

පර්යේෂණ සාරාංශ ලබාදිය යුතු අවසන් දිනය 2016 ජනවාරි මස 31 වේ. සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කිරීම සඳහා පිළිගත්තේද යන්න පෙබරවාරි 20 දින වන විට දැනුම් දෙනු ලැබේ.

සම්මන්ත්‍රණය සඳහා රාජකීය ආසියාතික සමිතියේ සාමාජිකයන් නොවන පුද්ගලයින්ට වුවද පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කළ හැකිය.

# සාමාජික ප්‍රකාශන

## බුද්ධ භූමි වන්දනා

**කර්තෘ - ඩබ්ලිව් රොබට් ගුණතිලක**

ඉන්දියාවේ පූජනීය ස්ථාන පිළිබඳව ලියැවී ඇති බොහෝ ග්‍රන්ථවල එකිනෙකට වෙනස් තොරතුරු ඇතුළත් වේ. එයට හේතු වී ඇත්තේ බෞද්ධ සාහිත්‍යය හා ජනප්‍රවාද මුල්කොටගෙන ඒවා රචනා වී තිබීමය. සූත්‍ර පිටකය ඇසුරෙන් බොහෝ දේ නිවැරදිව ඉදිරිපත් කළ හැකිව තිබුනද, වන්දනාකරුවන්ගේ භක්තිය උද්දීපනය කිරීම පමණක්ම අරමුණු කරගත් බොහෝ කතුවරුන් ඒ පිළිබඳව සැලකිලිමත් වී නැති බව පෙනේ.

එහෙත් ඩබ්ලිව්. රොබට් ගුණතිලක මහතාගේ 'බුද්ධ භූමි වන්දනා' කෘතියේදී ප්‍රමුඛතාවය ලබාදී ඇත්තේ වඩා නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමටය. එහෙත් ජනප්‍රවාද හා දිගුකාලීනව පැවතෙන අදහස්ද ඇතුළත් කර ඇත්තේ පාඨකයාට තීරණ ගැනීම පහසුවීම සඳහාය. පූජනීය ස්ථාන ඇති ප්‍රදේශවල ඓතිහාසික හා ස්ථානීය තොරතුරු මේ කෘතියට ඇතුළත් කිරීමෙන් පාඨක දැනුම වර්ධනය කර ගැනීම සඳහා වැඩි අවස්ථාවක් සලසා තිබේ.

බුදුන් උපන් ලුම්බිණිය, බුද්ධත්වය ලද බුද්ධගයාව, පළමු දහම් දෙසුම සිදු කළ සාරානාථය හා පිරිනිවන් පා වදාළ කුසිනාරාව වන්දනාකරුවන්ගේ අවධානයට ලක් වූ ප්‍රධාන ස්ථාන වුවද බුදුන්වහන්සේ හා සම්බන්ධ තවත් බොහෝ ස්ථාන පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමට මේ කෘතියේදී විශේෂ උත්සාහයක් දරා ඇත.


**පුරාවිදු පුවත්** - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ සාමාජිකත්වය වෙනුවෙන් පළකෙරෙන පුවත් හසුනයි.



**ආපසු:**
සංජීවනී විද්‍යාරත්න මිය
සම්බන්ධීකරණ ලේකම් - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.